# පාරිභෝගික අයිතිවාසිකම් සුරැකීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියෙහි කාර්යභාරය සහ එහි මාධ්‍ය භාවිතය

මෙම නිබන්ධය කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යාපති (ජනසන්නිවේදන)
පශ්චාත් උපාධි පාඨමාලාවේ පාර්ශවීය අවශ්‍යතාවක් සඳහා
ඉදිරිපත් කරන ලදී.

**එන්.ඒ.කේ.එච්. කුමාර**

**FGS/M/MSSc/2005/13**


| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 843 |
| වර්ග අංකය: | |


**කැලණිය විශ්වවිද්‍යාලය**

**කැලණිය**

**ශ්‍රී ලංකාව**

**2011 ජනවාරි**

## නිබන්ධ සාරාංශය (Abstract)

පාරිභෝගික අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම හෙවත් පාරිභෝගික ආරක්ෂණය සැළසීම සම්බන්ධයෙන් ලෝක ජනමතය ක්‍රම ක්‍රමයෙන් අවදිවන යුගයක, ශ්‍රී ලාංකික පාරිභෝගිකයා තවමත් සිය අයිතිවාසිකම් දිනාගැනීම අතින් අතිශය මන්දගාමී ස්වරූපයක් දක්වන අතර, එවැනි පරිසරයක් නිර්මාණය වීම සඳහා හේතු වූ සාධක අධ්‍යයනය කිරීම මෙම නිබන්ධයේ මූලික අරමුණයි.

මෙම අධ්‍යයනයේ සෙසු අරමුණු අතර, පාරිභෝගික අයිතිවාසිකම් පිළිබඳ පාරිභෝගියා සතු දැනුම සහ අවබෝධය අධ්‍යයනය කිරීම, පාරිභෝගික අයිතිවාසිකම් සුරැකීමේලා පාරිභෝගික අධිකාරිය සතු කාර්යභාරය විමර්ශනයට ලක්කිරීම සහ පාරිභෝගික අධිකාරිය සහ ජනතාව අතර ඇති සන්නිවේදන ගැටලු හඳුනාගැනීම වැදගත් වේ.

ශ්‍රී ලාංකික පාරිභෝගිකයා සබුද්ධිමත් පාරිභෝගිකයෙකු නොවන්නේ ඇයි ද ? යන්න සහ පාරිභෝගිකයා සහ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය අතර සන්නිවේදන ගැටලු පවතී ද? යන වග මෙහි අධ්‍යයන ගැටලු ලෙස යොදාගෙන ඇත.

ඉහත අරමුණු ඔස්සේ පර්යේෂණ ගැටලුවලට පිළිතුරු ගවේෂණ කාර්යයේ දී ප්‍රධාන පර්යේෂණ ක්‍රමය වශයෙන් ක්ෂේත්‍ර අධ්‍යයනය සිදුකරනු ලැබේ. ඒ සඳහා බස්නාහිර, දකුණ සහ සබරගමුව යන පළාත් තුන නියෝජනය වන පරිදි ගම්පහ, මාතර සහ රත්නපුර දිස්ත්‍රික්කවල පිහිටි ප්‍රධාන නගර ආශ්‍රිතව තෝරාගත් පර්යේෂණ ගහනයට, එක් දිස්ත්‍රික්කයකට පුද්ගලයින් 50 බැගින් 150 දෙනෙකු අහඹු ලෙස තෝරාගනු ලැබීය. මෙම අහඹු නියැදියට ප්‍රශ්නාවලියක් ලබා දී ඒ ඔස්සේ දත්ත රැස්කර විශ්ලේෂණය කිරීමෙන් පර්යේෂණ ගැටලුවලට හේතු කරුණු අධ්‍යයනය කරනු ලැබේ.

ඊට අමතරව මෙම විෂයට අදාල විශේෂඥයින් සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡා ඇසුරින් බොහෝ තොරතුරු අනාවරණය කරගත් අතර එම තොරතුරු මෙම පර්යේෂණයට බෙහෙවින් උපකාරී විය.



## මූලික පද (Keywords)

පාරිභෝගික ආරක්ෂණය (Consumer Protection)

පාරිභෝගික අයිතිවාසිකම් (Consumer Rights)

මහජන සම්බන්ධතා (Public Relation)

පාරිභෝගික කටයුතු (Consumer Affairs)

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය (Consumer Affairs Authority)

පාරිභෝගික කටයුතු පිළිබඳ සභාව (Consumer Affairs Council)